
# ඇලෝ සහ ලියෝ



# පිදුම

ආදරණීය අම්මාට.... තාත්තාට....

පොත් කියවීමට මා උනන්දු කළ මාගේ සියලු ගුරුවරුන්ට....

පොතක් ලිවීමට මා උනන්දු කළ මහාමායාවේ විදුහලපතිනිය ඇතුළු
සියලු ගුරුවරුන්ට......

ආදරයෙන් පුදමි......



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

🐱 පළමුවන කොටස 🐈

🌈එකමත් එක ගම්මානයක ඇලී කියලා පූසෙකුයි ලියෝ කියලා පූස් පැටියකුයි හිටියා.ටික දවසක් මේ ගෙදරට තාත්තා කෙනෙකුයි පුංචි ගෑණු ළමයෙකුයි ආවා.එයාලගේ ගෙදර හරියට මීයෝ ඉන්නවලු.එයාලා ආවේ පූස් පැටියෙක් ඉන්නවද කියලා බලන්නලු.ගෙදර අයිතිකාරයා ලියෝව දුන්නා.ලියෝ ඒ ගෙදර හිටපු අක්කගෙ නම දැනගත්තා.අක්කගේ නම ගිම්හානි . එයා කියන විදියට එයාට පුංචි මල්ලියකුත් ඉදලා.ඒත් ඒ මල්ලි නම් පූසන්ට කැමති නැල්ලු,ලියෝට ගොඩක් දුක හිතුනා.

* * * * * * * *

මේ ලියෝ හිටපු අලුත් ප්‍රදේශයේ කැලේක, තවත් පූසෙක් හිටියා.එයා පුංචි කාලේ ඉඳන්ම හිටිය එයාගේ නංගිත්් එක්ක.දවසක් වලහෙක් මේ පැත්තේ ඇවිල්ලා පුංචි පූසෝ දෙන්නවත් දැකලා!"නංගිව බේරගන්න ඕන"කියලා හිතපු ඒ කැලෑ පූසා නංගි පැත්තට නැතුව එයාගේ පැත්තට ඒ වලහාම ගෙන්න ගෙන!කොච්චර හොඳද බලන්න ඒ පූසා.එයා වලහට හොයාගන්න බැරි පැත්තකට ගිහිල්ලා.වලහා ආයෙත් එයාගේ ගුහාවට යද්දී කැලෑ පූසා දන්නෙම නැතුව ගිහිල්ලා වැවට වැටිලා.

මේ කැලෑ පූස ඒ වැඩේ කරද්දි ලියෝ හිටියේ ඒ වැව පැත්ත අඳුර ගන්න හොඳට ඒ පැත්ත විපරම් කර කරයි .ලියෝ කුරුල්ලන්ට ගොඩක් ආස නිසා එයා හිතුවේ කුරුල්ලෙක් වැවට වැටුණා තමයි කියලා.අපොයි දෙයියනේ!ලියොත් වැවට පැන්නා.ලියෝ පීනන්න දැනගෙන හිටපු නිසා එයා බයෙන් නෙවෙයි හිටියේ ඒත් එයාට කුරුල්ල හොයාගන්න බැරි වෙච්ච හින්දා එකපාරටම එයා ගොඩට එන්න ලෑස්ති වුණා.මේ අතරේ අර පුංචි කැලෑ පූසා ලියෝව අල්ල ගත්තේ ගොඩට එන්න එයා තාරාවා කියලා හිතලා. ඒ උනාට ඒ අල්ලගත්තු හින්දා ලියෝට ගොඩට එන්න බැරුව එයාවත් වතුර පෙවුනා..... !

ගිම් හානිගේ තාත්තා මේ දෙන්නාව ගොඩටගත්තා.ගිම්හානි දන්නවා එයාගේ පූසාව ඒත් මේ සිහි නැති වෙලා ඉන්න අනිත් පූස වනං එයා දන්නෙ නෑ.ටිකකින් දෙන්නටම සිහිය ආවා.ලියෝ ගිම්හානිව දැකල

හරිම සතුටින් දුවගෙන එයා ළඟට ගියා. කැලෑ පූසා පුදුමෙන් බලාගෙන හිටියා.

"මම බේරෙන්න කියලා අල්ලගත්තු පුංචි නැට්ට මේ පූසගේ නම්,මෙයා හරි සතුටින් ඉන්න කෙනෙක් වෙන්න ඕනෑ.නංගි එක්ක මටත් මෙහෙට එන්න ඕනේ"ඒත් ගිම්හානි" මේ පූසවත් ඇති කරමු" කියපු හින්දා ඇලෝට නංගිව හොයාගෙන යන්න බැරි වුණා."ඒත් මම එයාට සතුරන්ගෙන් ආරක්ෂා වෙන විදිහයි ඉගැන්නුවානේ. එයා හොඳින් ඇති"කියලා මේ කැලෑ පූසත් හිතුවා.

මේ යාලුවෝ දෙන්නා හරිම සතුටින් හිටියා.එක දවසක් ඔන්න ලියෝ මේ කැලෑ පූසගෙන් ඇහුවා එයාට උත්තර දෙන්න බැරි ප්‍රශ්නයක්.එයා ඇහුවේ" අපි මෙච්චරකල් සෙල්ලම් කළා. ඒත් මම ඔයාගේ නම දන්නෙ නෑ නේ. ඔයාගේ නම මොකක්ද" කියලා."ලියෝ මට මෙච්චර දවස් නමක් නම් තිබුණා. ඒත් මට ඒක හරියටම මතක නෑ. ඒක පටන් ගන්නේ ඇ අකුරින්"කැලෑ පූසා කිව්වා.

ඒක ආපු ලියෝට ගොඩක් දුක හිතුනා. එයා කැලෑ පූසත් එක්කගෙන ගියා ගිම්හානි ළඟට."ගිම්හානි, මෙයාට නමක් තිබුනලු. ඒත් එයාට ඒක මතක නැල්ලු. අපි මෙහාට නමක් දෙමුකෝ"එයා ගිම්හානිට කිව්වා."ලියෝ ඔයාගේ අම්මගේ නම ඇලී නේද?මට ඔයාගේ නමත් එක වුට්ටක් විදිහට පැටලුවම හොඳ අදහසක් නං ආවා"ගිම් හානි කිව්වා. "ඒ මොකක්ද ඒ?"කැලෑ පූසා පුදුමයෙන් ඇහුවේ එයාට වැටෙන නම මොකක්ද කියලා දැනගන්න."මම දන්නෑ කැලෑ පූසා මේක ඔයාට හොඳයිද කියලා. එහෙත් ඔයාගේ නමතමා........

ඇලෝ......!!"

"ෂා! ඒක ලස්සන නමක්!ගිම්හානි ඇත්තටම මම ඒ නමට ගොඩක් කැමතියි" ඇලෝ කිව්වේ සතුටින් උඩ පැන පැනයි.දැන් කවුරුත් එයාට කැලෑ පූසා කියලා කතා කරන්න ඕනි නෑ.ඉතින් මේ පූසො යාළුවො දෙන්නා හරිම සතුටින් සෙල්ලම් කර කර හිටියා.

ඔන්න එක දවසක ගිම්හානි නිදාගෙන හිටපු ලියෝටයි ඇලෝටයි කතා කරා.

"ඇලෝ ලියෝ මෙහෙ එන්න මට තියෙනවා ගොඩක් වැදගත් දෙයක් ඔයාල දෙන්නට කියන්න."එයා කිව්වෙ හරියට සිංදුවක් කියනවා වගෙයි.

"ලියෝ මේක නං ගොඩක් වැදගත් දෙයක් වගේ. සාමාන්‍යයෙන් ගිම්හානි අපිව මේ විදිහට ඇහැරවන්නේ නැනේ"ඇලෝ්ලියෝට කිව්වේ නිදිමත කඩන ගමන්

.ඇත්තටම ඇලෝ කිව්ව දේ හරි. මෙච්චර දවස් හානි එයාලා නිදාගෙන ඉන්නවනම් කන්නවත් කතා කරලා නෑ.

"ඇලෝ ලියෝ මම එන්න කිව්වේ ඔයාලා දෙන්නාට ටිකක් අමුතුම ආරංචියක් කියන්නයි.මට තාත්තත් එක්ක යන්න සිද්ධවෙලා තියෙනවා වෙනන ගමකට.ඔයා හිතනවා ඇති නේද"ඉතින් ඇයි මට කතා කළේ? ඇයි මාව එක ගෙන යන්නේ නැත්තේ?"කියලා?මම හොඳටම දන්නවලියෝ ඔයා කළු පාට බල්ලන්ට ගොඩක් බයයි කියල.ගමේ කෙසේ වෙතත් ඒ ගෙදරම ඉන්නවා ගෙදරින් යන්නැති කළු පාට ලොකු  බල්ලෙක්.මේකට මම දැන් හොඳම විසඳුම තමයි ඔයා ඇලොත් එක්ක කැලේට යන්නකෝ"

ඉතින් මේ පූසො දෙන්නා කියපු විදිහටම ලොකු කැලේකට යන්නයි පිටත් වුනේ.ඒ කැලේ තිබුනේ මෙයාලා හිටපු ගෙදර පිටිපස්සේ.අර ලොකු වැව තිබුණේ ගෙදරට දකුණු පැත්තේ.

ඉතින් මේ යාළුවො දෙන්ම කැලේ මැද්දටම ආවා. එයාලා නවතින්න හිටියේ ලොකු කන්දක් උඩ.මෙයාල කන්දෙන් බාගයක් විතර නැගලා.ඒත් මෙයාලට කන්ද නැගලා ගොඩක් මහන්සියි. ඒ වගේම ගොඩක් බඩගින්නේ හිටපු යාළුවො දෙන්නා ටිකක් විවේක ගන්න පඳුරක් ලඟ නැවතුනා.ලියෝ හදිසියේම ඇලෝවත් ඇදගෙන ලොකු ගහක් ලඟට ගියා."බලන්න ඇලෝ අර අතන ලොකු කොටියෙක්!"ඒ කොටියා එකපාරටම කුරුල්ල දෙන්නෙක්ව ඇල්ලුවා.එයා එතන හිටපු පොඩි කුරුල්ලව රස කර කර කෑවා.කාලා ඉවර වෙද්දිම ඒ කිට්ටුවෙන් මුවෙක් දුවලා ගියා.අනිත් ලොකු කුරුල්ලා අමතක



කරපු කොටියා මුවා පස්සෙන් දුවන්න පටන් ගත්තා.ගහ පිටිපස්සේ හිටපු ඇලෝයි ලියෝයි එතනින් එළියට අවා

"දැක්කාද ලියෝ අපේ පුදුම වාසනාවක් තියෙන්නේ.ඒ විතරක් නෙමේ. අපිට ලොකු කුරුල්ලෙකුත් හම්බවුණා ,ඒත් මට ඒත් මරපු නිසා දුකුත් හිතුනා .ඒත් අපි කොහොමද එක කුරුල්ලෙක්ව බෙදාගෙන කන්නේ?"ඇලෝ ලියෝගෙන් ඇහුවා.

"ඇලෝ එකට බය වෙන්න එපා. මම ළඟ හැමතිස්සෙම තියෙනවා පුංචි පිහියක්. මගේ කරපටිය අමුණලා තියෙන්නේ. අපි ඒක දෙකට කපනවා මම කිව්වේ මේ කුරුල්ලා මිසක් පිහිය එහෙම නෙවෙයි හරිද?"ඇලොට හිනා ගසවලා ලියෝ කිව්වා.

"ඒත් මට හිතෙන්නේ නම් එහෙම කුරුල්ල නිකන් කෑවම වැඩක් නෑ වගේ.ආ අර බලන්න අතන තියෙන්නේ අලි පේර ගහක් නෙමෙයිද?නෑ නෑ ඒක අලි පෙර ගහක් තමයි. අපිට අලි පේර අරගෙන කුරුල්ලත් එක්කම කන්න පුළුවන් වෙයි නේද?"ඒ කිව්ව ඇලෝ.

ඉතින් ඔන්න මේ යාළුවො දෙන්නා එතන කෑම කාලා විවේක ගත්තා.ඊට පස්සේ කන්ද උඩට නැග්ගා .කන්ද මුදුනේ ඉඳන් එයාල ටිකක් වටපිට බැලුවා.එයාලට හදිසියට පෙනුනේ ටිකක් ලොකු කොටුවක් වගේ ගුහාවක්.ඇලෝ කෑගැහුවා."ලියෝ මට ඔතන හොඳට මතකයි.එතන කොටියෙක් හිටියා. ඒත් බයවෙන්න එපා දැන් එයා ගිහිල්ලා.අපිට පුළුවන් මෙතන ඉන්න.ඔයා කැමතිද?"ඒ ඇලෝ අහපු ප්‍රශ්නෙට එයාගේ යාළුවත් කැමතියි වෙලා ඔලුව වැනුවා.

ඉතින් දැන් මේ දෙන්නට නම් අමාරු නෑ. ඒ දෙන්නා කන්න පල්ලෙහාට රූට ගෙනගියා.එයාලා ඒ කන්ද පල්ලෙහාටම රූට ගෙන ගිහිල්ලා ඒ ගල් ගුහාව ළඟටගියා.ලියෝ චුට්ටක් දුකින් වගේ මෙහෙමත් කිව්වා ."තරහ වෙන්න එපා ඇලෝ මම දෙයක් කියන්නද?මෙතන ටිකක් සීතලයි වගේ මට මෙතනට ළඟටම ආපු ගමන් සීතල දැනුනා" ලියෝ එහෙම කිව්වට ඇලෝටත් ගොඩක් සීතලයි..ඒත් එයා ඒකට විසඳුම දැනගෙන හිටියා.ඒකට උදව්ව උනේ එතනම තිබුණු කොට්ට පුළුන් ගහ.ඇලෝ ටික වෙලාවක් කොට්ට පුළුන් කඩලා ඒ වගේ පුළුන් අරගෙන ලොකු සිනිඳු දෙයක් හැදුවා.ඒක හරියට පොරෝනයක්

වගේ. ලියෝ සතුටු වුනේ ඒක තියෙනකන් එයාට සීතල දැනෙන්නෙ නැති වෙයි හින්දා.

🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈

🐱 දෙවන කොටස 🐈

🌈 දෙන්නම මහන්සියෙන් හිටපු නිසා, කෑම කාලෙ ඉවර වෙලා හිටපු නිසා ඒ දෙන්න දන්නෙම නැතුව පැය පහක් විතර නින්ද ගියා.එයාලා ඇහැරුනත් එයාලට රෑට මොකුත් කරන්නේ නැති නිසාමද කොහෙද එයාලා ආයෙත් නිදාගත්තා.ඉතින් ටිකක් වෙලාවකින් පාන්දර වෙලා උදෙත් උනා.ලියෝ නැගිට්ටේ ඇලෝගේ කටහඬ අහලයි.

"ලියෝ ,ලියෝ,උදේ වෙලා ඉක්මනට නැගිටින්න!අද අපි ගොඩක් දේවල් හොයාගන්න ඕනේ.ඔයා වැඩියෙන් නිදාගෙන" ඇලෝ ලියෝව ඇහැරුවා. ලියෝට මෙච්චර උදෙන් නැගිටලා පුරුදු නැති නිසා එයාට නැගිටින්න විනාඩි පහළොවක් විතර ගත වුණා.එයා ඇහැරුණාට පස්සේ පළවෙනියටම කලේ ඇලෝගෙන් ප්‍රශ්නයක් අහන එක."අ......ඇ...........ඇයි ඇලෝ මාව ඇහැරුවේ? දැන් අපි මොකද කරන්නේ? මට'ගොඩාක්...........නිදිමතයි!"ලියව ඇහැරෙව්වට ඇලෝට ඇත්තටම ඒක ගැන අදහසක් නම් තිබුණේ නෑ.එතකොටම කීච්බීච් කියලා අමුතු සද්දයක්



ඇහුණා."ලියෝ ඔයාට ඒක ඇහුණද මට නං හිතන්න ඒක එච්චර හොඳ සද්දයක් නෙවෙයි කියලා "ඇලෝ ලියෝට කිව්වත් ලියෝ එතන හිටියේ නම්

නෑ.එයා දැක්කේ පුංචි කුරුල්ලෝ දෙන්නෙකුයි ලොකු කුරලු අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි හිටපු කුරුලු කූඩුවක් එකපාරටම කඩන් වැටෙන විදිහ.ලියෝ එතැනට දුවලා ගියා.එයා දැක්කේ ඒක ගිරා කූඩුවක් කියලා.ඇත්තටම වැටිලා තියෙන්නේ ලොකු ගහක් විතරයි එයාලගේ කූඩුව ඒ ගහේ තිබුණු නිසයි එයාලට ඉන්න තැනක් නැතිව තියෙන්නේ. ලියෝ ඇලෝට කතා කළා ."ඇලෝ ඉක්මනට එන්න.කුරුලු කූඩුවක් කඩන් වැටිලා!"ඇලෝ එතනට දුවගෙන ආවා.

"ලියෝ අපි මෙයාලට අලුතෙන් ගෙදරක් හදලා දෙමු. එතකොට අද දවසේ කරන්න වැඩකුත් තියෙනවනේ.ඒත් අපි ඒක පටන් ගන්නේ කොහොමද?"ඇලෝ ලියෝගෙන් ඇහුවා."ඇලෝ අපි ඉස්සරවෙලාම හොයාගන්න ඕනේ ටිකක් දිරපු ගහක්.ඊට පස්සේ කරන්න ඕන දේ මම දන්නවා.ඔයා ඉක්මනට ඒ වැඩේ කරන්න ඒ වගේම ඒ යන පාරේ කජු ගහක් තිබුණොත් එහෙම ඒක තියෙන තැනත් මතක තියාගෙන එන්න"

ලියෝ එහෙම කීවම ඇලෝ එක පාරටම දුවල දුවලා ගියා.එයා ලියෝට කෑ ගැහුවා."ලියෝ ලියෝ!එන්න මගේ පස්සේ!ඔයා කියපු දේවල් තියෙන තැන මම දන්නවා. එන්න ඉක්මනට ඒත් අපි කොහොමද කජු මැලියම් ගන්නේ?"ඉතින් ලියෝ මේ වැඩේට හොයාගත්තේ ගහකින් වැටිලා ටිකක් ලොකු සිදුරක් තිබුණු පොල් ගෙඩියක්.එයා ලියෝගේ පිහියෙන් කජු ගහක පොත්තක් හූරමින් හිටපු ඇලෝ ළඟට ගියා.ඇලෝ මීට කලින් නියපොතුවලින් තමයි කජු හූරලා තියෙන්නේ, දැන් එයාට ඒක රිදිලයි තිබුනේ.ඉතින් ඔන්න කොහොම හරි .ඇලොයි ,ලියොයි කජු මැලියම් හූරගත්තා.

මේ දෙන්නා දිගටම ගියා.

ටික දුරක් යනකොට ඇලෝ කියපු ටිකක් දිරලා වගේ තිබුණු ලොකු ගහක් හමු වුණා .ඉතින් ඒ කිට්ටුවම තිබුණු වැලක ගැටගහගෙන මේ පූසෝ දෙන්නා ඉක්මනට කුරුල්ලෝ දිහාට දිව්වා.....

මේ කුරුල්ලෝ දෙන්නාගේ පැටව් දෙන්නගෙත් නම් දෙක ඇල්ලෝටයි ලියෝටයි දැනගන්න ලැබුණා.එක්කෙනෙක්ගේ නම රෝසි,අනිත් කෙනා

ලුණා.මේ පැටව් දෙන්නත් ගෙදර හදන හැටි බලන්න ඇලොයි ලියෝයි ළඟට ආවා.ටිකකින් ඇලොයි ලියෝයි ලී ටිකක් කපලා ඉවර වුණා.

.මේ දෙන්නා ඊට පස්සේ කජු ගහේ මැලියම්වලින් ටික ටික අරන් ලී කෑලි ඇලෙව්වා.ඊට පස්සේ ඇලෝ ආයෙත් රවුමක් ඇඳලා ලියෝගේ පිහියෙන් කැපුවා.ඊට පස්සේ ලස්සනට ඇටවුමට ඒ කෑල්ල ඇලෙව්වා....

ෂා!.................................දැන් තියෙනවා ලස්සන කූඩුවක් .....!

ගිරවුන් ඔක්කොටම හරියන්න ඇලොයි ලියෝයි තැනක් හොයාගෙන එල්ලුවා,ඒ කූඩුවට ගියපු පැටව් දෙන්නා ඇලෝටයි ලියෝටයි ස්තුති කළා .

"ඇලෝ අර බලන්න එතන මල් වත්තක්!අපි එතැනට ගිහිල්ලා මල් ටිකක් කඩාගෙන එමු"ලියෝ කිව්වා."ඔයා යන්න,මම දන්නවා ලස්සන අඹ ගෙඩි තියෙන ගහක්.මම මේ දෙන්නට පලතුරු අරගෙන එන්නම්"එහෙම කියපු ඇලෝ ඉක්මනට එතනින් ගියා.ඇලෝ ගිහිල්ලා පලතුරු කඩාගෙන එනකොටමයි ලියෝ මල් පැල ටිකක් අරගෙන ආවේ.ඒ දෙන්නා ඉතුරු වෙච්ච මැලියම් අරගෙන කපපු ලී කෑලි වලින් ලස්සන පෙට්ටි හැදුවා.ඇලෝ එක පෙට්ටියකට එයා ගෙනාපු අඹ ගෙඩි ටික දැම්මා.අනිත් පෙට්ටිවලට පස් පුරවපු ලියෝ,ඒ වගේ ලස්සන මල් පැල හැදුවා.ඊට පස්සේ ඒ පළතුරු ,මල් පැල පෙට්ටි ඔක්කොම ගිරා කූඩුව ළඟින් එල්ලුවා.දැන් එතන හරිම ලස්සනයි....!

"දැන් සතුටින් ඉන්න ලියෝ,ඔන්න අද දවසේ අපි ගිරවුන්ට ගොඩක් උදව් කළා"**ඇලෝ ලියෝට කිව්වා.**

🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛
🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛🐈‍⬛🐈‍⬛

තෙවන කොටස 🐈

🌈මේ යාලුවෝ සතුටින් මෙහෙම ඉන්න අතරේ මෙහෙට ලොකු නියගයක් ඇවිල්ලා!ඉතින් මේ පැත්තට දැන් වතුර ගොඩක් හිඟයි.අර වැව පැත්තට යන්න දෙන්නම නිහරීත උනේ නෑ.

එක දවසක් ඇලොයි ලියයි දැක්කේ ලස්සන පුංචි දිය පාරක්.මේ දෙන්නට මෙහෙම හිතුණා."සමහරවිට අපිට පුළුවන් වෙයි මේ වතුර පාරෙන් වතුර ටිකක් ගන්න"එහෙම හිතපු ඇලෝ ඒක ලියෝට කියන්න යද්දිම ලියෝ අනිත් පැත්තට ඒක ඇලෝට කිව්වා.දෙන්නම කල්පනා කළා.හදිසියේම ලියෝ ඇලොට මෙන්න මෙහෙම කිව්වා.ඇලෝ ඔයා මේ දිය පාරෙන් ගිරවුන්ට වතුර ගන්න ඒ විතරක් නෙමෙයි ඔයත් වතුර ගන්න.මම යනවා මේ වතුර පාර දිගේ සමහරවිට මේක ලොකු ගඟකට යන්නත් බැරි නෑ.එහෙම නේද?"

ඇලෝ මෙහෙම ලියෝට කිව්වා."ඒත් ලියෝ වැරදිලාවත් එක්ක වැවට ගියොත්?"ඒත් ලියෝ හිනා වුණා."බලන්න ඇලෝ වැව තියන පැත්ත කොහෙද කියලා?ඒත් මේ පුංචි දිය පාර නම් මේ පැත්තට යන්නේ නෑ.මට නිශ්චිත කරලා කියන්න පුළුවන් වැවට නෙවෙයි ඒක යන්නේ කියලා"ඇලෝ ලියෝට ඉඩ දුන්නා.එයා ගිරවුන්ට වතුර ටිකක් අරගෙන ලස්සන මල් පැළ වලටත් දැම්මා.ඒවගේ ලස්සනට මල් පිපෙයි කියලා එයා හිතුවා.

මේ අතර ලියෝ දිගටම ගියා.දැන් නම් මෙයාට හරිම මහන්සියි.ඉතින් මෙයා ටිකක් නැවතිලා බැලුවා එයා ඉන්නේ කොහෙද කියලා.එයා පුදුමෙන් පුදුමයට පත්වුණා.එයා හිටියෙ ලොකුම ලොකු ඇලක..!ඉතින් ලියෝ ආයෙත් මේ



දොළ පාර දිගේ දුවලා ගිහිල්ලා ඇලෝට මේ ගැන කිව්වා.ඉතින් දෙන්නම ඇවිල්ලා මේ දොළ පාරෙන් සතුටින් නෑවා.

🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛
🐈‍⬛ 🐈 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈‍⬛ 🐈

🐱 හතරවන කොටස 🐈

🌈 දැන් නම් නියග තත්ත්ව ගොඩක් වැඩියි.එයාලගේ ගල් ගුහාවෙ නෙවෙයි දැන් පූසෝ දෙන්නා ඉන්නේ.වැඩියෙන්ම ඉන්නේ දොළ පාරේ.ලියෝ ඇලෝ්ට මෙහෙම කියනවා"ඇලෝ මට හරිම රස්නෙයි.බලන්න මට දොළ පාරේ නිදියගෙන හිටියත්!ඒත් අපිට වාසනාව තියෙනවා.මේ දොළ පාරේ ඉඳලයි,පැණි බේරෙන පලතුරුයි නිසයි අපි සතුටින් ඉන්නේ.ඒ විතරක්ද?අපේ ගිරා පවුලත්!"ඇලෝ ඔලුව වැනුවා.එහෙත් එයා එකපාරටම නැගිට්ටා."ලියෝ ලියෝ,දැක්කද අර එන්නේ කවුද කියලා?"ලියෝ හැම තැනම ඔලුව කරකව කරකව බැලුවා.කවුරුත් නෑ "නෑ නෑ ලියෝ,අර බලන්න අර දොළ පාරේ ගහගෙන එන්නේ කවුද කියලා?"ලියෝ ඒ පැත්ත බලද්දී තමා තේරුනේ,ඒ රෝසි කියලා.ඉතින් ලියෝ,දුවලා ගිහිල්ලා වැලක් කඩාගෙන ආවා.ඊට පස්සේ ඒකෙ එක කොනක් ගැට ගහලා එයාගේ බෙල්ලට දාගත්තා.අනිත් කොනෙන් තොණ්ඩුවක් හදලා එයා ඒක රෝසිට දැම්මා.ඊට පස්සේ එයා හිමීට ඈතට යද්දි,රෝසිව ගොඩට ගන්න පුළුවන් වුණා.

"රෝසි,අපි එයාලට හොඳට කන්නත් බොන්නත් දීලා තියෙද්දි,ඇයි එයා මේ වතුර පාරට ආවේ?ඒක නම් රෝසිගෙන් අහන්න විදිහක් නෑ.බලන්න!එයාට සිහිය මදි වගේ.ඒක අපිට හොයාගන්න පුළුවන් වෙයි මෙයාගේ ගෙදරින්ම.නේද?"ලියෝ ඇලෝගෙන් මෙහෙම ඇහුවා.ඊට පස්සේ දෙන්නම ගියා රෝසිගේ ගෙදරට.ඒත් යද්දි..............කවුරුත් නෑ.....!



"මං හිතන විදිහට ලියෝ,රෝසි අපිව හොයාගෙන ඇවිත් තියෙන්නේ එයාලගේ ගෙදර කවුරුත් නැති හින්දා වෙන්න ඕනේ.ඒත් ඇයි?එයාලගේ අම්මලා කොහෙද ගිහින් තියන්නේ?"මේ ප්‍රශ්නෙට උත්තරේ දෙන්න කලින් රෝසි නැගිට්ටා."අනේ ඇලෝ ලියෝ,අම්මයි තාත්තයි මල්ලියි ගියානේ එක ගමනක්!මම උවමනාවෙන්මයි මෙහෙ ඉන්නම් කියලා කිව්වේ.ඊට පස්සේ මං ඔයාලා දෙන්න හොයාගෙන ආවා.ඒත් මාව අර දොළ පාරට වැටුණා.ඊට පස්සේ මට මතක ලියෝ වැලක් අරගෙන එනවා විතරයි.ඊට පස්සේ මට සිහිය නැති උනා.මම හිතන්නේ ලියෝ තමයි මාවගත්තේ"**රෝසි කිව්වා."කමක් නෑ රෝසි,ඔයා ඉන්න අපේ ගල්ගුහාවට වෙලා.අපි ඔයාට පලතුරු වගර් එහෙම ගේන්නම්.යන්න ගිහින් විවේක ගන්න"ලියෝ කිව්වා.**

**ඉතින් ඊට පහුවදා සිද්ධ වුණේ බය හිතෙන දෙයක්.ලියෝව ලොකු උකුස්සෙක් අරගෙන ගියා!මේක දැකපු ඇලෝ දුවලා ගිහින් බයෙන් හැංගුණා.ඒක දැකපු රෝසි පියාඹලා උඩට ගියා.ඊට පස්සේ එයා උකුස්සාව දැක්කා.ඉතින් බය වෙච්ච රෝසි ඉක්මනට ගිහින් ගහක උස අත්තක හැංගුනා.එතකොට එයා දැකපු දෙයින් එයා පුදුම වුණා.එයා දැක්කෙ උකුසු කූඩුව!රෝසි උකුස්සට කෑගැහුවා."ඒයි උකුස්සෝ මගේ යාළුවව අතෑරියේ නැත්නම්,මම ඔයාගේ කූඩුව කඩනවා...!"බයවුනු උකුස්සා ලියෝව අතෑරියා.**

ඇලෝ රෝසිට ස්තූති කළා.

- 🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈‍⬛🐈🐈‍⬛

🐱පස්වන කොටස🐈

🌈මේ කැලේට තිබුණ නියගය ඉවර වෙලා වැස්සා.ඉතින් දොළ පාරේ වතුර වැඩි නිසා ඇලොයි ලියොයි සතුටු වුණා.

එක දවසක් ලියෝ ගියා දොළ පාරට.එයා වැතිරීලා ඉද්දි නිකමට හිතුනා "මේ වතුර කොහෙටද යන්නේ?"කියලා.එයා දොළ දිගේ ගියා.එයා නතර වුණේ ගංගාවක !ලියෝ ආපසු එන්න හදද්දී එකපාරටම ගොරවන සද්දයක් ඇහිලා බය වුණා .එයා දුවන්න ලෑස්ති වෙද්දි එයාට පුරුදු කටහඬක්



ඇහුණා."ටිම්...බුරන්න එපා .ඒ හාවුන් වෙන්න ඇති "

ලියෝ පුදුමයට පත්වුණා .එතනින් ආපු කෙනාව එයාට හොඳට මතකයි .කොහෙන් හරි දැකලා තිබුණා,ඒ ගැහැනු ළමයව.ඒ ගෑනු ළමයා මෙහෙම කීවා.

"මේ ලියෝ නේද ?අනේ ලියෝ මාව මතකද?අපේ පරණ ගෙදර පිටිපස්සේ තිබුණ කන්ද ,අපේ අලුත් ගෙදරට දකුණු පැත්තේ තිබුණ නේද?අනේ මම ගිම්හානි ,ලියෝ"ලියෝත් එයා එක්ක යන්න ලෑස්ති වෙද්දී තමා එතනට ටිම් ආවේ.එයා දැකපු ලියෝ පස්සට පැන්නා."ටිම්,මේ ඉන්නේ ලියෝ.ඔයාටත්

කලින් මම එයාව දන්නේ .එයාට කරදරයක් කරන්න එපා"ඊට පස්සෙ තුන්දෙනා ගෙදර ගියා.

මේ අතර ඇලෝ ලියෝව හොයන ගමන් හිටියනේ .එකපාරටම ,එයා දැක්කේ ගල් ගුහාවක් .ආ..........! මේ එයාගේ නංගිගේ ගුහාව .....!ඇලෝ තවත් පුදුම උනේ එයාගෙ නංගිව දැකලා...!එයා පුදුම වෙලා නංගිත් එක්කම,ලියෝගෙ හැඩරුවත් කියලා ලියෝව හොයන්න ගියා.ඉතින් මේ දෙන්නා,ටිකෙන් ටික ගිම්හානිගේ ගෙදරටම ළඟා වුණා.ඉතින් මේ දෙන්නා දැක්කේ ඒ ගෙදර ළඟම හිටපු ටීම්ව.මෙයාලව දැකලා ටිම් බුරන්න ගත්තා.ඒ සද්ද ඇහුණු යනකන් හානි ලියෝ එක්ක එළියට බැහැලා බැලුවා.ඇලෝව දැක්ක ලියෝ සතුටින් එයා ළඟට දිව්වා.ඒක දැකපු ටීම් පුදුමයෙන් ඒ දෙන්න දිහා බලාගෙන හිටියා.ඉතින් ඇලෝ ලියෝට එයාගෙ නංගිවත් අඳුන්වලා දුන්නා.ඇලොගේ නංගිගේ නම ටිකි.ඉතින් ඒ තුන්දෙනා

එකිනෙකාව අඳුනගෙන,ගිහානිවයි ටිම්වයිත් අඳුන ගත්තා.ඉතින් ඒ තුන්දෙනා මෙහෙමමෙහෙමයි ඉන්නකොට හදිසියේම ගිරවෙක් පියාඹලා ආවා.ඇලෝටයි එක පාරටම තේරුනා ඒ ඉන්නේ රෝසි කියලා.රෝසි පියාඹලා ඇවිත්,ඇලොගේ වලිගෙ වැහුවා.

"අනේ රෝසි,මාව බේරගත්තට ගොඩක් ස්තුතියි"ලියෝ රෝසිට කිව්වා.ඉතින් රෝසිත් ගිම්හානි ගේ ගෙදර නැවතුනා.ඉතිං



**ගිම්හානි,ඇලෝ,ලියෝ,රෝසි,ටිම් එක්ක සතුටින් ජීවත් වුණා...🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈🐈‍⬛🐈**

**🪷නිමී......🪷**



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් " **හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිළමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්‍ය මණ්ඩලයටද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ )